International Journal of Community Resilience INJCR
CORRECT-19 Special Volume
Original Research
ISSN: 2773-7195
This project is funded by the European Union

# ලොක්ඩවුන් කාලයේදී ප්‍රජාවන්ගේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම: ශ්‍රී ලංකාවේ ශ්‍රි විසුද්ධාවාස බෞද්ධ මධ්‍යස්ථානයේ දායකත්වය

**NWANY විජේසේකර[1*], JPT සවින්තනී[1] , LM වල්පොල[1]**

[1] රෙසිලියන්ස් පර්යේෂණ, පුහුණු සහ උපදේශන ආයතනය

*මෙම සිද්ධි අධ්‍යයනය ශ්‍රී ලංකාවේ, මත්තෙගොඩ, ශ්‍රි විසුද්ධාවාස බෞද්ධ මධ්‍යස්ථානයේ, පූජ්‍ය. ඇඹිලිපිටියේ සෝභිත ස්වාමීන්වහන්සේ සමග සිදුකරන ලද සම්මුඛ සාකච්ඡාවක් මත පදනම්ව සකසන ලදි.*

* විද්‍යුත් ලිපිනය: novil.wijesekara@gmail.com https://orcid.org/0000-0002-0391-6220

ඉදිරිපත් කළ දිනය : 20.03.2021 ප්‍රකාශිත දිනය : 22.07.2021

https://doi.org/10.51595/11111126

**සාරාංශය**

මෙම සිද්ධි අධ්‍යයනය මගින් ඉදිරිපත් කෙරෙනුයේ සිව්වන අපේක්ෂිත භූමිකාව වන සමාජ සේවකයාගේ කාර්යභාරය සපුරාලමින් ලොක්ඩවුන් කාලය තුළදී නැවුම් නිෂ්පාදන සහ එළවළු බෙදා දී ප්‍රජාවට සහයෝගය දැක්වීම සඳහා ශ්‍රී ලංකාවේ මත්තේගොඩ ශ්‍රි විසුද්ධාවාස බෞද්ධ මධ්‍යස්ථානයේ පූජ්‍ය ඇඹිලිපිටියේ සෝභිත ස්වාමීන්වහන්සේ සහ එම කණ්ඩායම විසින් දරන ලද මහඟු ප්‍රයත්නයයි.

විශිෂ්ට භාවිත:

1. COVID−19 වසංගත සමයේ ආධාර සැපයීමේදී ප්‍රජාවේ අවශ්‍යතා ක්‍රමානුකූලව සපුරාලීම සඳහා ප්‍රතිලාභීන්ගේ ප්‍රමුඛතාවය සඳහා තාර්කික හා අවශ්‍යතා පදනම් කරගත් ප්‍රවේශයක් භාවිතා කළ හැකිය.
2. COVID−19 වසංගතය තුළ ආගමික නායකයින්ට ඔවුන්ගේ සමාජ සේවා කටයුතු කරගෙන යාමට සෞඛ්‍ය හා ආරක්ෂක හමුදා සමඟ සම්බන්ධීකරණය කළ හැකිය.

***ප්‍රමුඛ වචන*: *කෝවිඩ්* -19, *CORRECT-19*, *සමාජ සේවක***



ශ්‍රී විසුද්ධාවාස බෞද්ධ මධ්‍යස්ථානය, නාගරික ජනගහනයෙන් 4000 ක් සහ පවුල් 1200 කට ආසන්න සංඛ්‍යාවක් සඳහා පහසුකම් සපයමින් මත්තෙගොඩ, කිරිගම්පමුණුව, පොල්ගස්ඕවිට ප්‍රදේශයේ පිහිටා ඇත. අධ්‍යාපනය, නිවාස පහසුකම් හා ජීවන තත්ත්වය අනුව මෙහි ප්‍රජාව සමාජ ආර්ථික වශයෙන් විවිධත්වයක් පෙන්විය. ප්‍රජාවෙන් බහුතරයක් බෞද්ධ වූ අතර, කතෝලික/ ක්‍රිස්තියානි ධර්මය වැළඳගත් පවුල් කිහිපයක්ද ජීවත් වූහ. මෙම ප්‍රජාවේ පුද්ගලයින් රජයේ හා පෞද්ගලික යන අංශ දෙකෙහිම රැකියාවල නිරත වූ අතර, සමහරුන් ස්වයං රැකියා වල ද, අනෙක් පුද්ගලයන් දෛනික වැටුප් ලබා ගන්නා රැකියා වල ද නිරත වූහ. මෙම ප්‍රදේශයේ කුඹුරු කිහිපයක් හා ගෙවතු වගා ඇතුළු කුඩා වගා බිම් ද දක්නට ලැබිණ.



රූප සටහන 1 : ආහාර ද්‍රව්‍ය වර්ගීකරණය කරමින්

2020 මාර්තු මස, ශ්‍රී ලංකාවේ කෝවිඩ්-19 වසංගත තත්ත්වයේ ආරම්භයත් සමඟ, සතියක් ඇතුළත, මුළු දිවයිනට ම බල පැවැත්වෙන පරිදි පොලිස් ඇඳිරි නීතිය ක්‍රියාත්මක කරන ලදි. මෙම තත්ත්වය යටතේ, නිවෙස් තුළ රැඳී සිටීම හැරුණු කොට ජනයා හට වෙනත් විකල්පයක් නොවීය. බොහෝ සේවාවන්, මාර්ගගත හා දුරස්ථ ක්‍රම වෙත අනුවර්තනය වෙමින්, ප්‍රාථමික අවධියක පැවතුණි. ආහාර සහ අනෙකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය වල හිඟයක් ඇති විය. එබැවින්, දෛනික වැටුප් හා ස්වයං රැකියා වල නිරත වන පුද්ගලයන් හට ඔවුන්ගේ ජීවනෝපායෙහි යෙදීමට අපහසු තත්ත්වයක් පැන නැඟුනි. මේ හේතුවෙන්, ආහාර ද්‍රව්‍ය වල හිඟ කම සහ 'මිළදී ගැනීමේ හැකියාව' ,කෝවිඩ්-19, ලොක්ඩවුන් කාල වකවානුව තුළ ජනතාව මුහුණදුන් ප්‍රධාන අභියෝගයක් බවට පත්වූ තත්ත්වයක් උද්ගත විය.

"අපි පන්සලේ තිබුණු ද්‍රව්‍ය, අවශ්‍යතා ඇති අයට බෙදා දීමෙන් තමයි මෙය ආරම්භ කළේ", යැයි පූජ්‍ය. ඇඹිලිපිටියේ සෝභිත ස්වාමීන්වහන්සේ අදහස් දැක්වූහ. "අවශ්‍යතා ඇති අයට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සැපයීම සඳහා ආධාර කිරීමට සාපේක්ෂව මූල්‍යමය වශයෙන් ස්ථාවර වූවන්ට උපදෙස් දීමට අපට හැකි වුණා. ඒවගේම, රජයේ හා පෞද්ගලික අංශ සේවකයන්ගේ, ව්‍යාපාරිකයන්ගේ සහ ප්‍රදේශයේ සිට විදේශ රැකියා වල නියුතු පුද්ගලයන්ගේ සහයෝගය ද අපට ලැබුණා", ස්වාමීන් වහන්සේ වැඩිදුරටත් අදහස් දැක්වූහ. ආධාර මුදල් පැමිණ භාර දීමෙන් හා බැංකු ගිණුමට බැර කිරීමෙන් සිදු විය . ආහාර ප්‍රසම්පාදනය ක්‍රම දෙකකින් සිදු කරන ලදී . පළමු ක්‍රමය ආහාර ද්‍රව්‍ය සතොසෙන්, සම්පත් වෙළඳසැලින් හා මත්තෙගොඩ ප්‍රදේශයේ අනෙකුත් තොග වෙළඳ සැල් වලින් මිළදී ගැනීමයි. මෙම වෙළඳසල්, පාර්සල් ඇසුරුම් කිරීමට සහනාධාර කණ්ඩායමට නොමිළේ සහයෝගය දැක්වූ බව ද සඳහන් කළ යුතුය. දෙවන ක්‍රමය වන්නේ, රටේ දුර බැහැර ප්‍රදේශවල ගොවීන් සම්බන්ධ කරගෙන එළවළු ලබා ගැනීමයි. කෝවිඩ්-19 සංචරණ සීමා හේතුවෙන් මෙම දෙවන ක්‍රමය එතරම් පහසු කටයුත්තක් නොවීය. ලොරි රථ වලින් තම ගම ප්‍රදේශය වූ ඇඹිලිපිටිය සහ තණමල්විල දුරස්ථ ගොවිපලවලට ගොස් ආහාර ද්‍රව්‍ය පන්සලට රැගෙන ඒම සඳහා මත්තෙගොඩ පොලිසියෙන් සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (MOH) කාර්යාලයෙන් අවසරයක් ලබාගැනීමට ස්වාමීන් වහන්සේට හැකි විය. මෙම ක්‍රියාවලිය මුළුල්ලේම, ස්වේච්ඡා සේවකයන් පස් දෙනෙකුගෙන් යුත් කුඩා එහෙත් ශක්තිමත් හා කැපවීමෙන් යුත් කණ්ඩායමකට නායකත්වය උන්වහන්සේ විසින් ලබා දෙන ලදි. කෝවිඩ්-19 වළක්වා ගැනීමේ ක්‍රියාපිළිවෙත හේතුවෙන් කණ්ඩායම කුඩා හා හැසිරවීමට පහසු ආකාරයට තබා ගැනීම අවශ්‍ය විය.

පන්සලේ නායකත්වයෙන්, සහ ප්‍රදේශයේ පවුල් කිහිපයක දායකත්වයෙන්, වියළි සලාක පාර්සල් 150 සකසා ගන්නා ලදි. මෙම වියළි සලාක පාර්සල් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී විසින් නිර්දේශ කළ අඩුආදායම්ලාභී පවුල් ලයිස්තුවේ සිටින පවුල් වලට බෙදා දෙන ලදි. ස්වාමීන් වහන්සේ හා උන්වහන්සේගේ කණ්ඩායම මුහුණු පොත හරහා ඔවුන්ගේ සමාජ සේවා කටයුතු පිළිබඳව ප්‍රජාව දැනුවත් කරන ලදි, ඒ තුළින්, මෙම කර්තවය සඳහා මුදලින් පමණක් නොව, ද්‍රව්‍යමය ආධාර වලින්ද දායකවීමට කැමති තවත් බොහෝ පිරිසක් මෙයට සම්බන්ධ කර ගැනීමට අවස්ථාව ලැබුණි. මේ වන විට, තනි පුද්ගලයන් පමණක් නොව, මාධ්‍ය නාලිකා හා සුපිරි වෙළඳසැල් ද ස්වාමීන් වහන්සේගේ මෙම ප්‍රයත්නය සඳහා සහය වෙති.

පසුව, තවත් බොහෝ පිරිස් ස්වාමීන් වහන්සේගේ හා එම කණ්ඩායමේ ප්‍රජා සේවය සඳහා එකතු විය. කිරිගම්පමුණුව ප්‍රදේශවාසීන්ගෙන් ඇතැම් පිරිස් ඉඩකඩ සීමිත වුව ද ඔවුන්ගේ ගෙවත්තේ තමා වගා කරගත් එළවළු ද මේ සඳහා පරිත්‍යාග කරන ලදි. තවත් සමහරු ප්‍රජාව සමඟ බෙදාහදා ගැනීම සඳහා ගමේ ඇති ගස්වලින් පොල් හා කොස් කඩා ගැනීමට උදව් කළහ.

අවශ්‍යතා ඇති පවුල් වලට උදව් කිරීමට අමතරව, ස්වාමීන් වහන්සේගේ හා කණ්ඩායමේ නායකත්වයෙන්, පොලිසිය ආදී අත්‍යවශ්‍ය සේවාවන් වල නිරත 24/7 පළමු ප්‍රතිචාර දැක්වූවන් හට තේ සහ කැවිලි වලින් සංග්‍රහ කිරීමට ද ගම්වාසීහු කාරුණික වූහ.

මේ අතර ස්වාමීන් වහන්සේ ඇතුළු කණ්ඩායමට අභියෝග කිහිපයකට ද මුහුණ දීමට සිදු විය. ආරම්භයේ සිටම තරුණ පිරිස් මේ සඳහා ධනාත්මක හා සහයෝගාත්මක ආකල්පයක් දැරුව ද , වැඩිහිටි ප්‍රජාවේ ඇතැම් පුද්ගලයන් මෙම කර්තව්‍යය දෙස සැකමුසු කෝණයකින් බැලූහ. “අනිවාර්යයෙන් ම මේ ස්වාමීන් වහන්සේට ඊළඟ ඡන්දයට ඉදිරිපත් වීමේ බලාපොරොත්තුවක් ඇති. නැත්නම්, දුප්පත් මිනිස්සුන්ට කෑම ළඟට ගිහින් දීමේ උවමනාවක් නැහැ, ඔවුන්ට තනිවම තමන්ව බලා ගන්න පුළුවන්නේ!”, ආදී ලෙස ස්වාමීන් වහන්සේට ද ඇතැම් සාකච්ඡා කණවැකී තිබේ.



රූපසටහන 2 : එලවලු වර්ගකිරීම අධීක්ෂණය කරමින්

ප්‍රදේශයේ රජයේ නිලධාරීන් සහ පොලිසිය මෙම කර්තව්‍යය පිළිබඳව ද, ස්වාමීන් වහන්සේ හා එම කණ්ඩායම සෞඛ්‍ය උපදෙස් වලට අවනතව එහි නියැළෙන බව ද දැනුවත්ව සිටිය ද, දුර පළාත් වලට යාමේදී තත්ත්වය වඩාත් වෙනස් විය. කණ්ඩායමට ඔවුන්ගේ රථය සෑම මාර්ග බාධකයකම නැවැත්වීමට සිදු විය. ඇතැම් අය ඔවුන් ගංජා ප්‍රවාහනය කරන බවට ද සැක කොට ඇත! එබැවින්, මත්තෙගොඩට නැවත පැමිණෙන විට, පැය ගණනක ප්‍රමාදයට හේතු වෙමින්, විශාල එළවළු තොගය කිහිප වරක් ම නැවත නැවතත් පරීක්ෂා කොට ඇත.

කණ්ඩායම දුර පළාත් වෙත ගිය විට, වර්තමානයේ මෙන්ම, මත්තෙගොඩ පළමු කෝවිඩ්-19 රැල්ලේදී, රෝගය දරුණු ලෙස පැතිරී තිබූ ප්‍රදේශයක් බව ප්‍රකට බැවින්, ඔවුන් එළවළු මිලදී ගත් ඇතැම් ගොවියෝ කෝවිඩ්-19 ට ඇති අනිසි බිය නිසා ඔවුන්ව පෞද්ගලිකව හමුවීමට පැකුළුණහ.


වියළි සලාක බෙදා දීමේදී, විශේෂයෙන් ම ඒවා පටු මාවත් දිගේ ගෙන යාමට සිදු වූ අවස්ථා වලදී, ඒවා අදාළ නිවෙස් වෙත ගෙන යාමට තවත් පිරිස් එකතු විය. කෙසේවෙතත්, ඇතැම් පිරිස් මෙය සෞඛ්‍ය නීති රීති උල්ලංඝනයක් ලෙස සළකා, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (MOH) කාර්යාලයට හා මහජන සෞඛ්‍ය පරීක්ෂකට පැමිණිලි කළහ. අමතරව සම්බන්ධ වූ පිරිස් නිවෙස් වලට යැවීමෙන් අනතුරුව, ස්වාමීන් වහන්සේට හා කණ්ඩායමට පමණක් ආහාර ද්‍රව්‍ය බෙදාදීමේ කාර්යයේ නිරත වීමට අවසර ලැබිණ.

ස්වාමීන් වහන්සේ හා කණ්ඩායම මුහුණ දුන් ප්‍රධානතම ගැටළුවක් වූයේ අවශ්‍යතාවය මත ආහාර ද්‍රව්‍ය අත්‍යවශ්‍යය පුද්ගලයින් තෝරා ගැනීමයි. ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා බොහෝ උත්සාහයන් දැරුවද, අවශ්‍යතා ඇති අයට භාණ්ඩ නොලැබීම පිළිබඳව චෝදනා ද ලැබිණ. නමුත්, කාලයත් සමග, ස්වාමීන් වහන්සේට හා කණ්ඩායමට තවත් ආධාර උපකාර සොයා ගැනීමට හැකි විය, එනිසා පළමුවර ආධාර නොලැබුණු අයගේ අවශ්‍යතා පසුව සපුරාලීමට හැකි විය. අනතුරුව, තුන්වන වටය හරහා, ප්‍රදේශයේ මධ්‍යම ආදායම් ලබන පවුල් කිහිපයක අවශ්‍යතා සපුරාලීමට ද හැකියාවක් ලැබිණ. එසේම, අවශ්‍යතා ඇති පවුල් සඳහා සිදු කළ උපකාර සියල්ල ආගම් හෝ ඇදහිලි භේදයකින් තොරව සිදු කරන ලද බව ද මෙහිදී සැළකිල්ලට ගත යුතුය.

මුහුණ දීමට සිදුවූ තවත් අභියෝගයක් වූයේ, ස්වාමීන් වහන්සේ හා එම කණ්ඩායමට මුදල් ආධාර පරිත්‍යගකරන්නන් සිටියද, කෝවිඩ්-19 තත්ත්වය හේතුවෙන් භාණ්ඩ සපයා ගැනීමට අපහසු වීමයි. දිනෙන් දින, වෙළඳපල තුළ සැපයුම් ක්ෂය වෙමින් පැවතුනි. මෙම අභියෝගය ජයගැනීම සඳහා ස්වාමීන් වහන්සේ ඇතුළු කණ්ඩායම භාවිතා කළ විසඳුම වූයේ දුරස්ථ ගොවීන් හා සම්බන්ධ වීමයි.

ප්‍රධානතම බාධකය වනුයේ වියළි සලාක නොලැබුණු පුද්ගලයන්ගෙන් එල්ල වන චෝදනා ය. එනමුත්, ප්‍රමුඛතාවය ලබා දුන්නේ අඩු ආදායම්ලාභී පවුල්

ලයිස්තුවට අනුව බවට ඉවසිලිමත්ව ඔවුන් හට කරුණු පහදා දීමෙන් එම චෝදනා සමතයට පත් කිරීමට ස්වාමීන් වහන්සේට හැකි විය. (රූප සටහන 1).




**රූපසටහන 3 : අවශ්‍යතා මත පවුල්වලට ප්‍රමුඛතාවය ලබාදීම.**

රූප සටහන 3 ට අනුව, පළමු වටයේ දී හදිසි අවශ්‍යතා සහිත අඩු ආදායම්ලාභී පවුල් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලදී. දෙවන වටයේ දී, අඩු ආදායම්ලාභී පවුල්වල සෙසු අයට සහාය විය. එමෙන්ම, තුන්වන වටයේදී සංචරණ සීමා හා සැපයුම හිඟ බැවින් ආහාර ද්‍රව්‍ය ලබා ගැනීමට අපහසු මධ්‍යම ආදායම් ලබන පවුල් වලට ද ආහාර පාර්සල් බෙදා දීමට උන්වහන්සේට හැකිවිය.



**රූපසටහන 2 : බෙදා දීමට සූදානම් කරන ලද එළවළු මළු**

ගරුතර ස්වාමින් වහන්සේ හට කුඩා කාලයේ පටන් ම මෙවැනි විපත් වලදී සහනාධාර ලබාදීමේ අත්දැකීම් ඇත. උන්වහන්සේ සාමණේර නමක ව සිටි කාලයේද, ගරුතර හිපන්කන්දේ සද්ධාසිරි අනුනායක ස්වාමීන් වහන්සේ සමග රටෙහි විවිධ ප්‍රදේශ වල ගංවතුර, නියඟ හා සුනාමි ආදියෙන් පීඩාවට පත් විවිධ ප්‍රජාවන්ට සහනාධාර ලබාදීම් සඳහා විවිධාකාරයෙන් දායක වී ඒවායෙන් උගෙන ඇත. එම අත්දැකීමෙන් ලත් මගපෙන්වීමෙන් ස්වාමීන් වහන්සේ මෙම දුෂ්කර කාල වකවානුවේදී නිතැතින්ම ප්‍රජාවට සහයෝගය දැක්වීමට පන්නරය ලබා ඇත.
මේ අනුව, අසරණ අයට උපකාර කිරීමේ පුරුද්ද ශ්‍රී ලංකාවේ බෞද්ධ භික්ෂූන් වහන්සේලාට පුහුණුවන අවදියේ සිටම සිදුවන ක්‍රියාවලියක් වූ බව පැහැදිලිය.

COVID-19 වසංගත සමයේ ප්‍රජාවන්ට උපකාර කිරීමෙන් උගත හැකි පාඩම් ගැන මෙනෙහි කරමින්, ගරුතර ස්වාමින් වහන්සේ ප්‍රකාශ කළේ නාගරික ප්‍රදේශවල පවා කම්පන සහ ආතතීන් ඇති වූ විට ශ්‍රී ලංකා ප්‍රජාව සහයෝගයෙන් කටයුතු කරන බවයි. කොවිඩ්-19 වසංගත සමයේ ආගමික නායකයින්ගේ අපේක්ෂිත භූමිකාවන් අටෙන් එකක් වන සමාජ සේවක භූමිකාව ඉටු

කරනු වස් ආදර්ශවත් කාර්යභාරයක් ඉටු කර ඇත (Wijesekara and Jayasinghe 2021).

"බෞද්ධ භික්ෂූන් වහන්සේලා ලෙස, අපගේ ප්‍රජාවන් වෙනුවෙන් පෙනී සිටීමට හා නායකත්වය සැපයීමට හැකි ප්‍රබල ස්ථානයක අපි හිඳිනවා. අපි බොහෝ දුරට ලෞකික සම්පත් අත්හැර තිබෙනවා. එහෙයින්, අපට දීර්ඝ කාලීන පෞද්ගලික සැළසුම් හෝ වගකීම් තබා ගැනීමට අපහසුයි. එමනිසා ම, ආගමික නායකයන් වන අපට, වැඩි නිදහසක් හා අවස්ථාවක් තිබෙනවා ප්‍රජා යහපැවැත්ම හා ගැටළුකාරී අවස්ථාවලදී ප්‍රජා ප්‍රතිරෝධීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා දායක වීමට". ගරුතර ඇඹිලිපිටියේ සෝභිත ස්වාමීන් වහන්සේ පැවසූහ. ඉදිරි වැඩකටයුතු පිළිබඳ විමසූ විට උන්වහන්සේ මේ බව පැවසූහ. "ප්‍රජාවන් සැමවිටම ගතික වන අතර ඔවුන්ට මීළඟට පැමිණෙන හදිසි තත්ත්වය කුමක්දැයි නිර්ණය කිරීම අපහසුයි, නමුත්, ඉදිරියේදී කුමක් සිදු වුවද ඒ සඳහා මුහුණ දීම සඳහා ප්‍රජාව සූදානම් කිරීමට භික්ෂුවට දැඩි කැපවීමක් තිබිය යුතුයි."

## References:

Wijesekara, NWANY, and Dimantha Jayasinghe. 2021. "The CORRECT-19 Model: Eight Desired Roles of Religious Leaders during the COVID-19 Pandemic." *International Journal of Community Resilience*. doi: https://doi.org/10.51595/11111121.